# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1903/2 - 2015 පෙබරවාරි මස 23 වැනි සඳුදා - 2015.02.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත**

52 වන වගන්තිය යටතේ වූ නියමය

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 52 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ විදුලිබල සහ බලශක්ති විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම,

(අ) මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉඩම, විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා වහාම අවශ්‍ය වන බවට ; සහ

(ආ) එකී විදුලිබල සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය, මහජන කාර්යයක් වන බැවින් මහජනතාවගේ පොදු සුභ සාධනය සහ ප්‍රතිලාභය සඳහා ඉවහල් වන බවට

අදහස් කරන හෙයින්, එකී ඉඩම එම කාර්යය සඳහා අවශ්‍ය වන බවට මෙම නියෝගයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2015 පෙබරවාරි මස 20 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

***ඉඩමේ මායිම්***

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සියඹලාගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාගොඩ ග්‍රාමයේ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු සී. එච්. ඩී. අභයගුණවර්ධන විසින් මැන සාදන ලද 1992.08.25 දිනැති අංක 1040 දරන මානක සැලැස්මෙහි කැබලි අංක $4^{E}$ සහ $4^{D}$ මගින් නිරූපණය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර 5, රූඩ් 2, පර්චස් 6.625 ක් වූ ඉඩමට මායිම් පහත දැක්වෙන පරිදි වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 1040 දරන මානක සැලැස්මෙහි පොල්ගස්ඕවිට - කොට්ටාව පාර ; |
| *නැගෙනහිරට* | : | අංක 1040 දරන මානක සැලැස්මෙහි දෙපා ඇල ; |
| *දකුණට* | : | අංක 1040 දරන මානක සැලැස්මෙහි දෙපා ඇල, ඩී. එම්. මානාන, චන්ද්‍රා ජයවීර හා වෙනත් අය සතු කුඹුරු හා ඕවිට සහ ඩී. එස්. වීරවර්ධන හා වෙනත් අය සතු කැනුවල ඕවිට ; |
| *බටහිරට* | : | අංක 1040 දරන මානක සැලැස්මෙහි ඩී. එස්. වීරවර්ධන හා වෙනත් අය සතු කැනුවල ඕවිට, ලීලාවතී විජේසිංහ හා වෙනත් අය සතු කොහිලවල කුඹුර, පී. ගුණදාසට අයිති ඉඩම සහ පාර. |
| *ප්‍රමාණය* | : | අක්කර 5, රූඩ් 2, පර්චස් 6.625 |
| *හිමිකම් කියන අය* | : | ඒ. එම්. ෂානිල් ප්‍රනාන්දු |

03 - 229

1A - G 21054 — 55 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*